(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1963 පෙබරවාරි මස 11 වෙනි දින පටන් 1963 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා ඩී. බී. රාසනායගම් මහතා මඩකලපුව ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබීය.

එල්. එස්. බී. පෙරේරා,
සථිර ලේකම්.

1963 පෙබරවාරි මස 11 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

3-368

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**කුරුණෑගල ආරෝග්‍යශාලා මණ්ඩලය**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1963 පෙබරවාරි මස 22 වෙනි දින පටන් 1963 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පී. බී. ඒකනායක මහතා කුරුණෑගල ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබීය.

එල්. එස්. බී. පෙරේරා,
සථිර ලේකම්.

1963 පෙබරවාරි මස 22 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

3-371

## 1946 ලංකා (ප්‍රාදේශික බල මණ්ඩල) රාජසභා ආඥාව

### අංක 25—හොරණ මැතිවරණ දිස්ත්‍රික්කය

පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමති තුමා විසින් නගර සභා ආඥාපණතේ (255 වැනි පරිච්ඡෙදය) 5, 6 සහ 14 වැනි වගන්ති යටතේ සහ ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපණතේ (262 වැනි පර්ච්ඡෙදය) 84 වැනි වගන්තිය යටතේ 1962 මැයි මස 17 වැනි දින අංක 13, 124 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන්ට යෙදුන නියෝග අනුව ඉහත සඳහන් මැතිවරණ දිස්ත්‍රික්කයේ ''ආර්'' සහ ''එස්'' යන අක්ෂර දරණ ඡන්ද කොට්ඨාශ වෙනුවෙන් 1961 ජූලි මස 5 වැනි දින අංක 12,506 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රජසභා ආඥාවේ 10(3) වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරන්ට යෙදුන දැන්වීමේ උපලේඛනයේ සඳහන් විස්තර වෙනුවට පහත සඳහන් උපලේඛනයේ සඳහන් විස්තර යෙදිය යුතු බව මෙයින් දනුම් දෙමි.

මැතිවරණ කාර්යාලය, කළුතර,
1963 පෙබරවාරි මස 15 දින.

පී. එච්. වී. ද සිල්වා,
සහකාර ලියා පදිංචි කිරීමේ නිලධාරිතැන,
අංක 25–හොරණ මැතිවරණ දිස්ත්‍රික්කය.

#### උපලේඛනය

| ඡන්ද කොට්ඨාශය | නියමිත අක්ෂරය හෝ අක්ෂර | ඡන්දය විමසන ස්ථානය හෝ ස්ථාන පිහිටුවනු ලබන ප්‍රදේශ |
|---|---|---|
| රයිගම් කෝරළේ පිහිටි හොරණ නගර සභා ප්‍රදේශයේ අංක 1 දරණ ගල්ඒදඬුගොඩ කොට්ඨාශය සහ අංක 2 දරණ පිරිවෙන කොට්ඨාශය සහ අංක 3 දරණ උඩවත්ත කොට්ඨාශය සහ අංක 3 දරණ උඩවත්ත කොට්ඨාශයට ඇතුලත්වූ ඇල්ලකන්දවත්තේ කොටස සහ අංක 7 දරණ හල්තොටියාවත්ත කොට්ඨාශයේ කොටස | ආර් ... | කොට්ඨාශ අංක 3 උඩවත්ත |
| රයිගම් කෝරළේ පිහිටි හොරණ නගරසභා ප්‍රදේශයේ අංක 4 දරණ මුනගම කොට්ඨාශය සහ අංක 4 දරණ මුනගම කොට්ඨාශයට ඇතුලත්වූ හැගල්ල වතුයායේ කොටස සහ අංක 5 දරණ හොරණ මධ්‍යම කොට්ඨාශය සහ අංක 5 දරණ හොරණ මධ්‍යම කොට්ඨාශයට ඇතුලත් වූ සොරණ වතුයායේ කොටස සහ අංක 6 දරණ වැවල කොට්ඨාශය සහ අංක 6 දරණ වැවල කොට්ඨාශයට ඇතුලත්වූ හැගල්ල වතුයායේ කොටස සහ අංක 7 දරණ හල්තොටියවත්ත කොට්ඨාශයේ කොටස | එස් | කොට්ඨාශ අංක 5 හොරණ මධ්‍යම |

3—238/1

---

## 1946 ලංකා (ප්‍රාදේශික බල මණ්ඩල) රාජසභා ආඥාව

### අංක 26—බුලත්සිංහල මැතිවරණ දිස්ත්‍රික්කය

පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් ගම්සභා ආඥාපණතේ (256 වැනි පරිච්ඡෙදය) 5(1) වැනි වගන්තිය යටතේ සහ ප්‍රාදේශික බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපණතේ (262 වැනි පරිච්ඡෙදය) 84 වැනි වගන්තිය යටතේ 1962 පෙබරවාරි මස 16 වැනි දින අංක 12,934 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන්ට යෙදුන නියෝගය සහ ගම්සභා ආඥා පණතේ (257 වැනි වගන්තිය) 8 වැනි වගන්තිය යටතේ 1962 පෙබරවාරි මස 23 වැනි දින අංක 12,937 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන්ට යෙදුන නියෝගය අනුව ඉහත සඳහන් මැතිවරණ දිස්ත්‍රික්කයේ ''කියු'', ''ආර්'', ''ඇස්'' ''ටී'', සහ ''යූ'' යන අක්ෂර දරණ ඡන්ද කොට්ඨාශ වෙනුවෙන් 1959 සැප්තැම්බර් 8 වැනි දින අංක 11,849 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 10(1) වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරන්නට යෙදුන දැන්වීමේ උප ලේඛනයේ සඳහන් විස්තර වෙනුවට පහත සඳහන් උප ලේඛනයේ සඳහන් විස්තර යෙදිය යුතු බව මෙයින් දනුම් දෙනු ලැබේ.

මැතිවරණ කාර්යාලය කළුතර,
1963 පෙබරවාරි මස15 වෙනි දින.

පී. එච්. වී. ද සිල්වා,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරිතැන,
අංක 26—බුලත්සිංහල මැතිවරණ දිස්ත්‍රික්කය.

#### උපලේඛනය

| ඡන්ද කොට්ඨාශය | නියමිත අක්ෂරය හෝ අක්ෂර | ඡන්දය විමසන ස්ථානය හෝ ස්ථාන පිහිටුවනු ලබන ප්‍රදේශ |
|---|---|---|
| රයිගම් කෝරළේ පිහිටි වේරවත්ත, වල්පිට සහ කනන්විල යන ගම් සහ නිව්වැටල් වතුයායේ නාගහකන්ද ඩිවිෂන් යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්තබාගේ පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 2 දරණ වේරවත්ත කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි මහයාල, කුඩායාල, අකුරුකලවිට සහ අම්පිටිගල යන ගම් සහ අම්පිටිගලවත්ත යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 3 දරණ මහයාල කොට්ඨාශය | කිව් ... | වේරවත්ත |
| රයිගම් කෝරළේ පිහිටි උඩුගම්මන, මුරුද්දෙනිය, සහ මාබෝගොඩ යන ගම්වලින් යුක්තවූ මුන්වත්තබාග පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 4 දරණ මාබෝගොඩ කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි අඟුරුවාතොට සහ නිව්වැටල් වතුයායේ හෝම් ඩිවිෂන් යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්ත බාගෙ පත්තු නැගෙනහිර ගම් සභා ප්‍රදේශයේ අංක 5 දරණ අඟුරුවාතොට කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි මදුරාවල යන ගමින් යුක්තවූ මුන්වත්තබාගෙපත්තු නැගෙනහිර ගම් සභා ප්‍රදේශයේ අංක 6 දරණ මදුරාවල කොට්ඨාශය | ආර් ... | මදුරාවල |
| රයිගම් කෝරළේ පිහිටි ඉලිඹෙ සහ කන්දන යන ගම් සහ සොරණ වතුයායේ කටුහේන ඩිවිෂන්, සොරණ වතුයායේ ඉලිඹෙ ඩිවිෂන් සහ දික්හේන වත්ත යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු නැගෙනහිර ගම් සභා ප්‍රදේශයේ අංක 1 දරණ ඉලිඹෙ කොට්ඨාශය | ඇස් ... | ඉලිඹෙ |
| රයිගම්කෝරළේ පිහිටි බැල්ලපිටිය සහ මාහේන යන ගම් සහ හැගල්ල වතුයායේ අරඹෙකන්ද ඩිවිෂන්, සොරණ වතුයායේ කටුහෙන් ඩිවිෂන් සහ දික්හේන වත්ත යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 14 දරණ බැල්ලපිටිය කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි රෙමුන සහ රෙමුනවත්ත යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්ත බාගේ පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 15 දරණ රෙමුන කොට්ඨාශය | ටී .... | බැල්ලපිටිය |
| රයිගම් කෝරළේ පිහිටි කෙහෙල්ලෙනාව, දෙටගොඩ ඉවුදුගොඩ, කුඩැල්ල, පාදගල සහ උරතුඩාව යන ගම් වලින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 10 දරණ කෙහෙල්ලෙනාව කොට්ඨාශය | යූ ... | කෙහෙල්ලේනාව |

3—238/2

## 1946 ලංකා (ප්‍රාදේශික බලමණ්ඩල) රාජසභා ආඥාව

### අංක 27—බණ්ඩාරගම මැතිවරණ දිස්ත්‍රික්කය

පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් ගම්සභා ආඥාපණතේ (256 වැනි පරිච්ඡෙදය) 5(1) වැනි වගන්තිය යටතේ සහ ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥා පණතේ (262 වැනි පරිච්ඡෙදය) 84 වැනි වගන්තිය යටතේ 1962 පෙබරවාරි මස 16 වැනි දින අංක 12,934 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන්ට යෙදුන නියෝගය සහ ගම්සභා ආඥා පණතේ (257 වැනි වගන්තිය) 8 වැනි වගන්තිය යටතේ 1962 පෙබරවාරි මස 23 වැනි දින, අංක 12,937 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන්ට යෙදුන නියෝගය අනුව ඉහත සඳහන් මැතිවරණ දිස්ත්‍රික්කයේ '' එක්ස් '', '' වයි '', '' ඉෂඩ් '', '' ඒඒ'', '' බීබී '', '' සීසී '', '' ඩීඩී '', '' ඊඊ '', '' ඇෆ් ඇෆ් '', '' ජීජී '', '' එච්එච් '', ''අයිඅයි '', '' ජේජේ '', සහ '' කේකේ '' යන අක්ෂර දරණ ඡන්ද කොට්ඨාශ වෙනුවෙන් 1959 සැප්තැම්බර් මස 8 වැනි දින අංක 11,849 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 10(1) වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරන්නට යෙදුන දැන්වීමේ උපලේඛනයේ සඳහන් විස්තර වෙනුවට පහත සඳහන් උපලේඛනයේ සඳහන් විස්තර යෙදිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. එච්. වී. ද සිල්වා,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන,
අංක 27—බණ්ඩාරගම මැතිවරණ දිස්ත්‍රික්කය.

මැතිවරණ කාර්යාලය, කළුතර,
1963 පෙබරවාරි 15 දින.

### උපලේඛනය

| ඡන්ද කොට්ඨාශය | නියමිත අක්ෂරය හෝ අක්ෂර | | ඡන්දය විමසන ස්ථානය හෝ ස්ථාන පිහිටුවනු ලබන ප්‍රදේශ |
|---|---|---|---|
| රයිගම් කෝරළේ පිහිටි බටගොඩ යන ගමින් යුක්තවූ මුන්වත්තෙ බාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 11 දරණ බටගොඩ කොට්ඨාශය සහ රයිගම් කෝරළයේ පිහිටි දෙඹගොඩ සහ පිලෝකුපිටිය යන ගම් වලින් යුක්තවූ මුන්වත්තේ බාගෙ පත්තු බටහිර ගම් සභා ප්‍රදේශයේ අංක 12 දරණ දෙඹගොඩ කොට්ඨාශය | එක්ස් | ... | දෙඹගොඩ |
| රයිගම් කෝරළයේ පිහිටි යටවර යන ගමින් යුක්තවූ, මුන්වත්තේ බාගෙ පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 10 දරණ යටවර කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි පනාගොඩ යන ගමින් යුක්තවූ මුන්වත්ත බාගේ පත්තු නැගෙනහිර ගම් සභා ප්‍රදේශයේ අංක 11 දරණ පනාගොඩ කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි බේගමුව සහ තලහිටිය යන ගම් සහ පුටුපාවුල වතුයායේ හින්ක්ස්ටන් ඩිවිෂන් යන ප්‍රදේශයෙන් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 12 දරණ බේගමුව කොට්ඨාශය | වයි | ... | යටවර |
| රයිගම් කෝරළේ පිහිටි ගල්පාත සහ බරුහුපොල යන ගම්වලින් යුක්තවූ මුන්වත්ත බාගෙ පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 13 දරණ ගල්පාත කොට්ඨාශය | ඉෂඩ් | ... | ගල්පාත |
| රයිගම් කෝරළේ පිහිටි පැල්පොල යන ගමින් යුක්තවූ මුන්වත්ත බාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 1 දරණ පැල්පොල සහ අංක 2 දරණ ඉඹුලහේන කොට්ඨාශය | ඒඒ | ... | පැල්පොල |
| රයිගම් කෝරළේ පිහිටි උඩවර සහ නිව්වැටල් වතුයායේ හෝම් ඩිවිෂන් යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්ත බාගෙ පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 7 දරණ උඩුවර කොට්ඨාශය | බීබී | ... | උඩුවර |
| රයිගම් කෝරළේ පිහිටි දෙල්ගොඩ යන ගමින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 8 දරණ දෙල්ගොඩ කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි පාතකඩ සහ නිව්වැටල් වතුයායේ පොල් බිදිනකන්ද ඩිවිෂන් යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු නැගෙනහිර ගම්සභා ප්‍රදේශයේ අංක 9 දරණ පාතකඩ කොට්ඨාශය | සීසී | ... | පාතකඩ |
| රයිගම් කෝරළේ පිහිටි ලබුගම යන ගමින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 14 දරණ ලබුගම කොට්ඨාශයේ කොටසක් | ඩීඩී | ... | ලබුගම |
| රයිගම් කෝරළේ පිහිටි යාලගල යන ගමින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ ඡන්ද කොට්ඨාශය '' ඩීඩී '' අක්ෂරවලට ඇතුලත් නොවූ අංක 14 දරණ ලබුගම කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි පැටිගමුව යන ගමින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 13 දරණ පැටිගමුව කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි වෙනිවැල්පිටිය යන ගමින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 15 දරණ වෙනිවැල්පිටිය කොට්ඨාශය | ඊඊ | ... | වෙනිවැල්පිටිය |
| රයිගම් කෝරළේ පිහිටි කෙන්නන්තුඩාව සහ නිව්වැටල් වතුයායේ දික්හේන ඩිවිෂන් යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 16 දරණ කෙන්නන්තුඩාව කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි ලග්ගන, මාදම්පෙ සහ මාවතගම යන ගම්වලින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 7 දරණ ලග්ගන කොට්ඨාශය | ඇෆ්ඇෆ් | ... | මාවතගම |
| රයිගම් කෝරළේ පිහිටි හල්තොට, කෙලෙස්ගමුව, සහ නාගොමුව යන ගම්වලින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 8 දරණ හල්තොට සහ අංක 9 දරණ ලෙනවැ කොට්ඨාශ | ජීජී | ... | හල්තොට |
| රයිගම් කෝරළේ පිහිටි වැලිකල සහ තිබ්බොටුගොඩ යන ගම් සහ හැගල්ල වතුයාය යන ප්‍රදේශයෙන් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 17 දරණ වැලිකල කොට්ඨාශය | එච්එච් | ... | වැලිකල |
| රයිගම් කෝරළේ පිහිටි ගුංගොමුව යන ගමින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 18 දරණ ගුංගොමුව කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි බෙල්ලන්තුඩාව සහ ඕකන්දුව යන ගම් වලින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 19 දරණ බෙල්ලන්තුඩාව කොට්ඨාශය | අයිඅයි | ... | ගුංගොමුව |
| රයිගම් කෝරළේ පිහිටි පරගස්තොට සහ මිල්ලෙනිය වත්ත යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 3 දරණ පරගස්තොට කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි රද්දගොඩ යන ගමින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 4 දරණ රද්දගොඩ කොට්ඨාශය | ජේජේ | ... | පරගස්තොට |
| රයිගම් කෝරළේ පිහිටි මිල්ලෙනිය, කැටගොඩ, බොද්දෙල්ගොඩ සහ දමින්ගමුව යන ගම්වලින් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 5 දරණ මිල්ලෙනිය කොට්ඨාශය සහ රයිගම් කෝරළේ පිහිටි අරකාගොඩ සහ රම්මැණිකේ යන ගම් සහ මිල්ලෙනිය වත්ත සහ නිව්වැටල් වතුයායේ මිල්ලෙනිය ඩිවිෂන් යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ මුන්වත්තබාගෙ පත්තු බටහිර ගම්සභා ප්‍රදේශයේ අංක 6 දරණ අරකාගොඩ කොට්ඨාශය | කේකේ | ... | මිල්ලෙනිය |

## 1946 ලංකා (ප්‍රාදේශික බලමණ්ඩල) රාජ සභා ආඥාව

### අංක 28—පානදුර මැතිවරණ දිස්ත්‍රික්කය

පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමති තුමා විසින් නගර සභා ආඥා පණතේ (255 වැනි පරිච්ඡෙද) 5, 6 සහ 14 වැනි වගන්ති යටතේ සහ ප්‍රාදේශික බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපණතේ (262 වැනි පරිච්ඡෙදය) 84 වැනි වගන්තිය යටතේ 1962 මැයි මස 17 වැනි දින අංක 13,124 දරණ අති විශේෂ ගැසට් පලයේ ප්‍රසිද්ධ කරන්ට යෙදුන නියෝගය අනුව ඉහත සඳහන් මැතිවරණ දිස්ත්‍රික්කයේ, ''අයි'', ''ජේ'', ''කේ'', ''ඇල්'', ''ඇම්'' සහ ''ඇන්'' යන අක්ෂර දරණ ඡන්ද කොට්ඨාශ වෙනුවෙන් 1961 ජූලි මස 5 වැනි දින අංක 12,506 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 10(3) වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරන්නට යෙදුන දැන්වීමේ උපලේඛනයේ සඳහන් විස්තර වෙනුවට පහත සඳහන් උපලේඛනයේ සඳහන් විස්තර යෙදිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

පී. එච්. වී. ද සිල්වා,<br>
සහකාර ලියා පදිංචි කිරීමේ නිළධාරි තැන,<br>
අංක 28—පාණදුර මැතිවරණ දිස්ත්‍රික්කය.

මැතිවරණ කායර්‍යාලය, කළුතර,<br>
1963 පෙබරවාරි මස 15 දින දීය.

### උපලේඛනය

| ඡන්ද කොට්ඨාශය | නියමිත අක්ෂරය හෝ අක්ෂර | ඡන්දය විමසන ස්ථානය හෝ ස්ථාන පිහිටුවනු ලබන ප්‍රදේශ |
|---|---|---|
| පානදුර තොටමුනේ පිහිටි පානදුර නගර සභා ප්‍රදේශයේ අංක 2—පට්ටිය නමැති කොට්ඨාශය වේ ... | අයි ... | කොට්ඨාශ අංක 2—පට්ටිය |
| පානදුර තොටමුනේ පිහිටි පානදුර නගර සභා ප්‍රදේශයේ අංක 3—පට්ටිය උතුර නමැති කොට්ඨාශය වේ ... ... | ජේ ... | කොට්ඨාශ අංක 3—පට්ටිය උතුර |
| පානදුර කොටමුනේ පිහිටි පානදුර නගර සභා ප්‍රදේශයේ අංක 4—උයන්කැලේ දරණ කොටසද, කොට්ඨාශ අංක 5—මෝදරවිල නමැති කොට්ඨාශයේ කොටසක් ද, සහ කොට්ඨාශ අංක 8—වෑකඩ උතුර නමැති කොට්ඨාශයේ කොටසක් ද, වේ | කේ ... | කොට්ඨාශ අංක 4—උයන්කැලේ |
| පානදුර තොටමුනේ පිහිටි පානදුර නගර සභා ප්‍රදේශයේ අංක 6—නල්ලූරුව දරණ කොටස ද, අංක 5—මෝදරවිල නමැති කොට්ඨාශයේ කොටසක් ද වේ | ඇල් ... | කොට්ඨාශ අංක 6—නල්ලූරුව |
| පානදුර තොටමුනේ පිහිටි පානදුර නගර සභා ප්‍රදේශයේ අංක 7—වෑකඩ දරණ කොටස, සහ අංක 8—වෑකඩ උතුර දරණ කොට්ඨාශයේ කොටසක් වේ | ඇම් .... | කොට්ඨාශය අංක 7—වෑකඩ |
| පානදුර තොටමුනේ පිහිටි පානදුර නගර සභා ප්‍රදේශයේ අංක 9—උඩහමුල්ල දරණ කොටසද, අංක 8—වෑකඩ උතුර දරණ කොට්ඨාශයේ කොටසක්ද වේ | ඇන් ... | කොට්ඨාශ අංක 9—උඩහමුල්ල |

3–238/4

---

## නිවරද කිරීමයි

1962 දෙසැම්බර් 18 සහ 24 යන දින සහ අනුපිළිවෙළින් අංක 13,439 සහ 13,447 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රවල පළවූ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ අංක 10(3) දරණ ඡෙදය යටතේ දැන්වීම්වල පහත සඳහන් පරිදි නිවරද විය යුතුයි :—

### 1962.12.18 දින සහ අංක 13,439 දරණ ගැසට් නිවේදනය

1. අංක 13—ජා ඇල මැතිවරණ කොට්ඨාශය—

''ජේ'' දරණ ඡන්ද කොට්ඨාශ විස්තරයේ කල්එලිය යන වචනයට පූර්වයෙන් ''කොටසක්වූ'' යන්න ලොප් කළ යුතුයි.

2. අංක 14—මහර මැතිවරණ කොට්ඨාශය—

''ඒ'' දරණ ඡන්ද කොට්ඨාශ විස්තරයේ ''සූරියපාලුව'' වෙනුවට ''සූරිපාලුව''.

3. අංක 15—දෙම්පේ මැතිවරණ කොට්ඨාශය—

(අ) ''එන්'' දරණ ඡන්ද කොට්ඨාශ විස්තරයේ ''දියවල'' වෙනුවට ''දියවාල''.

(ආ) ''පී'' දරණ ඡන්ද කොට්ඨාශ විස්තරයේ ''වල්පිට'' වෙනුවට ''පැල්පිට''.

4. අංක 17—කොලොන්නාව මැතිවරණ කොට්ඨාශය—

''බී'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''මුල්ලේරියාව උඩුමුල්'' වෙනුවට ''මුල්ලේරියාව-උඩුමුල්ල''.

5. අංක 20—මොරටුව මැතිවරණ කොට්ඨාශය—

(අ) ''ටී'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''අකුකවලින්'' වෙනුවට ''අංකවලින්''.

(ආ) ''එක්ස්'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''ඇතුලත්වූ'' යන වචනය ලොප්කිරීමෙන්.

### 1962.12.24 දින සහ අංක 13,447 දරණ ගැසට් නිවේදනය

6. අංක 7—කටාන මැතිවරණ කොට්ඨාශය—

''පී'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''ආවිඅම්බලම ගම්සහා ප්‍රදේශයේ'' වෙනුවට ''ආඩිඅම්බලම පළාත ගම්සභා ප්‍රදේශයේ''.

7. අංක 9—මීරිගම මැතිවරණ කොට්ඨාශය

(අ) ''ඩී'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''කන්දලාම'' වෙනුවට ''කන්ඩලම''.

(ආ) ''ඊඊ'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''කෙන්දලන්ද'' වෙනුවට ''කැන්දලන්ද''.

(ඇ) ''එප් එප්'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''වදුරව'' වෙනුවට ''වදුරුව''.

(ඈ) ''ජීජී'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''කොත්තල'' වෙනුවට ''කොට්ටල''.

(ඉ) ''ජේජේ'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''හක්වදුන්න'' වෙනුවට ''හක්වඩුන්න''.

(ඊ) ''එල්එල්'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''ඇල්ලාලමුල්ල'', ''නඹුලුව'' වෙනුවට ''ඇල්ලලමුල්ල, නාඹුලුව''.

(උ) ''එන්එන්'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''හෙදදෙනකන්ද'' වෙනුවට ''හැඩිදෙනිකන්ද''.

(ඌ) ''ඕඕ'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''රදවදුන්න'' වෙනුවට ''රදවඩුන්න''.

8. අංක 10—මිනුවන්ගොඩ මැතිවරණ කොට්ඨාශය—

(අ) ''ප්‍රා.ආ.නි. කොට්ඨාශය—උතුරු අළුත්කුරු කෝරලේ'' යන්න අගට ''(බී)'' එකතු කිරීමෙන්.

(ආ) ''ඊ'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''දෙවාලපොල'' සහ ''දේවාලපොල'' යෙදී ඇති තැන්හි ''දෙවලපොල'' යන්න යෙදීමෙන්.

(ඇ) ''කේ'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''වීගොඩ'' වෙනුවට ''විගොඩ'' යෙදීමෙන්.

(ඈ) ''ආර්'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''හෙලකන්දනා'' වෙනුවට ''හෙලකන්දන''.

(ඉ) ''ටී'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''පත්තදූවන'' වෙනුවට පත්කඩුවන.''

(ඊ) ''එෆ්එෆ්'' දරණ මැතිවරණ කොට්ඨාශයේ ''වතමුල්ල'' වෙනුවට ''වතුමුල්ල''

9. අංක 11—අත්තනගල්ල මැතිවරණ කොට්ඨාශය—

(අ) ''සී'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''කෝරසගොඩ'' වෙනුවට ''කොරසගොඩ''.

(ආ) ''එෆ්'' දරණ ඡන්ද කොට්ඨාශයේ දැනට ඇති ඡන්ද කොට්ඨාශ විස්තරය වෙනුවට පහත සඳහන් විස්තරය යෙදීමෙන් :—

''දළුක්ගම ගම්සභා ප්‍රදේශයේ අංක 12 දරණ කොට්ඨාශයෙන් යුක්ත වූ අංක 315 දරණ (මීවල සහ කිත්තම්මහර) අංක 316 දරණ (බෝගොඩ) සහ අංක 317 දරණ (කත්තොට) ගම්මුලාදෑනි කොට්ඨාශ''.

(ඇ) ''වී'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''වැබොඩගල්ල'' වෙනුවට ''වේබොඩගලල''.

(ඈ) ''වයි'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''කඹුරුගල්ල'' වෙනුවට ''කඹුරාගල්ල''.

(ඉ) ''බීබී'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''ඇල්ලක්කල'' වෙනුවට ''එල්ලක්කල''.

(ඊ) ''අයිඅයි'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''බෝපෙත්ත'' වෙනුවට ''බෝපැත්ත''.

(උ) ''ජේජේ'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''කුරුවලාන'' වෙනුවට ''කුරවලාන''.

(ඌ) ''එල්එල්'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''ඕපතහැල්ල'' වෙනුවට ''ඕපත්ඇල්ල''.

10. අංක 12—ගම්පහ මැතිවරණ කොට්ඨාශය—

''ඊ'' දරණ ඡන්ද කොට්ඨාශයේ ''ගෝනෙගහ'' වෙනුවට ''ගෝනගහ''.

පී. පී. තම්බයියා,

අංක 7—කටාන මැතිවරණ කොට්ඨාශය, අංක 9—මීරිගම මැතිවරණ කොට්ඨාශය, අංක 10—මිනුවන්ගොඩ මැතිවරණ කොට්ඨාශය, අංක 11—අත්තනගල්ල මැතිවරණ කොට්ඨාශය, අංක 12—ගම්පහ මැතිවරණ කොට්ඨාශය, අංක 13 ජා ඇල මැතිවරණ කොට්ඨාශය, අංක 14—මහර මැතිවරණ කොට්ඨාශය, අංක 15—දෙම්පෙ මැතිවරණ කොට්ඨාශය, අංක 17—කොලොන්නාව මැතිවරණ කොට්ඨාශය, අංක 20—මොරටුව මැතිවරණ කොට්ඨාශය යන කොට්ඨාශවල.

ලියාපදිංචිකිරීමේ නිලධාරිතැන.

1963 පෙබරවාරි මස 8 වැනි දින,
කොළඹ කච්චේරියේ දීය.
3–238/5

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 11/63 දරන ආනයන පාලන දැන්වීම

### ඛණිජ තෛලමය නිෂ්පාදන

පහත දැක්වෙන ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා දැන් පුද්ගලික ආනයන බලපත්‍ර අවශ්‍ය බව ආනයනකයින් හට මෙයින් දන්වනු ලැබේ :—

| ආනයන පාලන වර්ගීකරණය අංක | | ද්‍රව්‍ය විස්තරය |
|---|---|---|
| 28 | ... | ඩීසල් තෙල් |
| 29 | ... | ගිනි උදුන් තෙල් |
| 30 | ... | ගෑස් තෙල් |
| 124 | ... | ඛණිජ තෙල්, ශුද්ධ කළ (භූමි තෙල් සහ පැට්‍රෝල් ඇතුළු) |

2. 1962 ඔක්තෝබර 10 වෙනි දින අංක 13,342 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1962 ඔක්තෝබර 10 වෙනි දින අංක 44/62 දරන ආනයන පාලන දැන්වීමත් 1962 ඔක්තෝබර 11 වෙනි දින අංක 13,343 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1962 ඔක්තෝබර 11 වෙනි දින අංක 45/62 දරන ආනයන පාලන දැන්වීමත් යථෝක්ත ප්‍රමාණයට මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. පහත විස්තර කර ඇති ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා හැම අංකයක් එල්ලේ ම දැක්වෙන උපරිම මි. ර. නැ. ගා. යටත් කොට ආනයන බලපත්‍ර දෙනු ලැබේ :—

| විස්තරය | | | අධිරාජ්‍ය ගැලුමකට උපරිම මි. ර. නැ. ගා. අගය ශත (ලංකා) |
|---|---|---|---|
| (1) ඔක්ටේන් නොම්මරය (පර්යේෂණ ක්‍රමය) 78 වැඩි නමුදු, 89 අඩු මෝටර් ගැසොලින් (පැට්රල්) | ... | ... | 35.93 |
| (2) ඔක්ටේන් නොම්මරය (පර්යේෂණ ක්‍රමය) 89 හෝ ඊට වැඩි මෝටර් ගැසොලින් (පැට්රල්) | | | 44.49 |
| (3) ආලෝකකාරී භූමි තෙල් | ... | ... | 51.07 |
| (4) ඩීසල් තෙල් (කාර්මික ඩීසල් තෙල්) ඩීසල් සූචිය 42 වැඩි නමුදු 52 අඩු | ... | ... | 44.45 |
| (5) ඩීසල් සූචිය 52 හෝ ඊට වැඩි, ඩීසල් තෙල් (ගෑස් තෙල්) | ... | ... | 46.41 |
| (6) ගිනි උදුන් තෙල් | ... | ... | 26.57 |

4. මෙම ආනයන පාලන දැන්වීමේ දින දී මෙම ද්‍රව්‍ය සඳහා ඉතිරිව තිබෙන සියලු ඇණවුම් සම්බන්ධයෙන් ඉහත 3 ඡේදයේ සඳහන් කර ඇති පදනම උඩ බලපත්‍ර දෙනු ලැබේ. බලපත්‍ර සඳහා වූ ස්වකීය අයැදුම් මෙම දෙපාර්තමේන්තුවේ 7 අංශය වෙත එවන ලෙස ආනයනකයින්ගෙන් ඉල්ලනු ලැබේ.

5. මෙම දැන්වීමේ දින හෝ ඊට පෙර නෞකා ගත කරන ලද යථෝක්ත ද්‍රව්‍ය සම්බන්ධයෙන් පුද්ගලික ආනයන බලපත්‍ර අවශ්‍ය නැති බව ආනයනකයින්ට සිහිපත් කරවනු ලැබේ.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1963 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ.

3-365

---

## කො/ශ්‍රී ධර්මරාජ පිරිවෙන, මොරටුමුල්ල මොරටුව

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුමුල්ලේ ශ්‍රී බොධිරුක්ඛාරාමයේ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියාපදිංචි කිරීමට විටියල පුඤ්ඤාලඞ්කාර ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් දවසක් ඇතුළත මේ ඉල්ලීමට විරුද්ධතාවයක් ඇති නම් මාවෙත දැන්විය යුතුයි.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

ඊ. ඇම්. බී. 60.
1963 පෙබරවාරි මස 25 වෙනි දින,
කොළඹ මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.
3-249

## උකස් පනත

වාණිජ අධ්‍යක්‍ෂ, ගිනිගේ රිචර්ඩ් වෝල්ටර් ද සිල්වා වන මම, (89 අධිකාරය වන) උකස් පනතේ අංක 3 (ඇ) සහ 114 (2) දරණ වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සීමාසහිත සිලෝන් පිනෑන්ස් ඇන්ඩ් සිකියුරිටීස් සමාගම, එම පනතේ කාර්යයන් සඳහා පිළිගත් ණයදෙන ව්‍යාපාරයක් වශයෙන් මෙම නිවේදනයෙන් ප්‍රකාශයට පමුණුවා සිටිමි.

ජී. ආර්. ඩබ්ලිව්. ද සිල්වා,
වාණිජ අධ්‍යක්‍ෂ.

1963 පෙබරවාරි 22 දින,
කොළඹ දී ය.

3-216

---

## දැන්වීමයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වල්ගම්පත්තු කෝරළේ කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 470 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1963. 2. 8 දින අංක 13,515 දරණ ආණ්ඩුවේ, ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1963 මාර්තු 2 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කාර්යාලයේ දීය.

3-348

---

## දැන්වීමයි

උතුරු මැද පළාතේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත නැගෙනහිර කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 470 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962.11.30 දින අංක 13,407 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1963 මාර්තු 2 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කායභීලයේ දීය.

3-347

---

## කොළරා රෝගය—කුඩ්ඩලෝර් වරාය

කුඩ්ඩලෝර් වරායෙහි කොළරා රෝගය පැතිර ගොස් ඇත. එබැවින් කුඩ්ඩලෝර්හි සිට පැමිණෙන මගීන් ගෙන් කොළරා රෝගයට අත් එන්නත් කිරීමේ සහතිකයට අමතරව ලංකාවේ කිසියම් වරායක ගොඩ බාන අළුත් මාළු, කටුවෙන් ආවරණ වූ මාළු (ෂෙල් පිෂ්), එළවළු, පලතුරු, හකුරු, මස්කට් (එසේ නැතහොත් කොළරා රෝගය පැතිර යෑමට අදාළ වෙන වෙනත් ආහාර ද්‍රව්‍යයන්) ලංකාවට ගෙන ඒම තහනම් කර ඇත.

2. කුඩ්ඩලෝර් වරාය කොළරා රෝගයෙන් තොරවූ වහාම තවත් දැන්වීමක් පළ කරනු ලැබේ.

අධ්‍යක්‍ෂක,
නිරෝධායන දෙපාර්තමේන්තුව.

නිරෝධායන කාර්යාලය,
කොළඹ, 1963.3.2.

3-341

---

අංකය : ග්‍ර./6.

## අනුමතිය සඳහා ඉදිරිපත් කරන පාසල් පොත්

මෙම මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන 1964 වෂීය වෙනුවෙන් අනුමත කරන ලද සම්පූර්ණ පාසල් පන්ති පොත් ලැයිස්තුවට ඇතුළත් කරවා ගැනීමට බලාපොරොත්තු වන 1963.12.31 වැනි දින අනුමතිය අවසාන වන සෑම පොතක් ම 1963 වෂීයේ මාර්තු 31 වැනි දිනට පෙර මෙම කායභීලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව ප්‍රකාශකයින් හා ග්‍රන්ථ කතෘවරුන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. යම්කිසි වෂීයක් අවසානයේදී අනුමතිය අවසන් වන පොත් වල අනුමතිය අළුත් කරවා ගැනීමට බලාපොරොත්තු වන ග්‍රන්ථ කතෘවරුන් සහ ප්‍රකාශකයින්ද ඒ වෂීයේ මාර්තු 31 වැනි දිනට පෙර ඒ පොත් මෙම කාර්යාලයයට එවිය යුතුය.

2. අනුමතිය අළුත් කරවා ගැනීමට යම්කිසි වෂීයක මාර්තු 31 වැනි දිනට පසුව ඉදිරිපත් කරනු ලබන පොත් එම වෂීය අවසානයේ නිකුත් කරනු ලබන ලැයිස්තුවට ඇතුළත් නොකරනු ලබන බව විශෙෂයෙන් ම නිවේදනය කිරීමට සිදු වී ඇත.

3. නියමිත දිනට පෙර ඉදිරිපත් කළ පොතක් සඳහා වුවද යම්කිසි නොවැළැක්විය හැකි හේතුවක් නිසා අනුමතිය දීම පමාවුවහොත්, එම පොත මෙම ලැයිස්තුවට ඇතුළත් නොවීම පිළිබඳව මණ්ඩලය වග නොකියයි.

4. ඊළඟ වෂීයට පාසල් පොත් නියම කරනු ලබන්නේ වෂීය අවසානයේ නිකුත් කරනු ලබන සම්පූර්ණ පන්ති පොත් ලැයිස්තුව අනුව හෙයින් නියමිත දිනට පොත් ඉදිරිපත් කොට තමන්ගේ පොත් පිළිබඳ අනුමතිය ලැබෙන බවට වගබලා ගන්නා හැටියට ප්‍රකාශකයින් හා ග්‍රන්ථ කතෘවරුන් වෙත අවධාරණයෙන් මතක් කර සිටිමි.

බර්ටි ජයසූරිය,
අ.ග්‍ර.ප්‍ර.උ.ම./ලේකම්.

1963ක් වූ මාර්තු මස 4 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේදී ය.

3-402

---

## රථ වාහන වලට අවහිර

### රයිගම-අඟුරුවාතොට පාර—කළුතර දිස්ත්‍රික්කය

රයිගම-අඟුරුවාතොට පාරේ අංක 6/2 දරණ පාළම නැවත සෑදීම සඳහා එම පාරේ 4 වෙනි සැතපුමේ සිට 7 වෙනි සැතපුම දක්වා වූ මාර්ග කොටස තව දුරටත් නිවේදනය කරණ තෙක් 63.3.11 වෙනි දින සිට රථ වාහන උදෙසා වසා තබනු ලබන බව සාමාන්‍ය මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කෙරේ. මේ හැරුණු විට ඇති අනිකුත් මාර්ග යාලගල-වැවල, හොරණ-අළුත්ගම සහ කිරිමැටියයාල හරහා ඇති මාර්ගයන් ය.

සී. මා. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්‍ෂ වෙනුවට,

1963. 2. 28.
රජයේ වැඩ කාර්යාලය,
කොළඹ 1.

3-355

---

## රථ වාහන වලට අවහිර

### කෝට්ටෙ-බෝපෙ මාර්ගය—දකුණු කොළඹ දිස්ත්‍රික්කය

කෝට්ටෙ-බෝපෙ පාරේ බත්තරමුල්ලේ මංසන්ධියේ සිට කොස්වත්ත මංසන්ධිය දක්වා වූ මාර්ග කොටස රථ වාහන උදෙසා වසා තැබීම 63. 3. 16 වෙනි දින දක්වා දීර්ඝ කොට ඇති බැව් සාමාන්‍ය මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කෙරේ.

මේ හැරුණු විට ඇති අනිකුත් මාර්ගය වැලිකඩ සහ කලපලුවාව හරහා ඇති මාර්ගය වේ.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්‍ෂ වෙනුවට.

63. 2. 28.
රජයේ වැඩ කාර්යාලය,
කොළඹ.

3-356

---

## වතුරට ගසාගෙන එන ලී අඩු අඩුක් කරන ස්ථානය

### වන ආඥාපනත යටතේ ප්‍රකාශයට පත් කිරීම

ඌරුගොඩවත්තේ දුව ප්‍රදර්ශන හා විකුණුම් මධ්‍යස්ථානය වතුරට ගසාගෙන එන ලී දඬු අඩුක් කරන ස්ථානයක් වන බව 1956 නව නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 451 වන අධිකාරයේ වන ආඥාපනතේ 30 (2) වගන්තිය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

එම්. නමසිවායම්,
ජ්‍යෙෂ්ඨ සහකාර වන සංරක්‍ෂක.

වන සංරක්‍ෂකගේ කායභීලය,
කොළඹ, 1963 මාර්තු මස 2 වන දින.

3-423

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි